සනීපතා ආර්ථික දර්ශක



2026 ඔක්තෝබර් 30

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සතියේ සුවිශේෂී කරුණු

මූර්ත අංශය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2026 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 8.0හි සිට 2026 ඔක්තෝබර් මාසයේ දී සියයට 8.3ක් දක්වා ඉහළ ගියේය. ආහාර සහ ආහාර නොවන උද්ධමනය පිළිවෙළින් සියයට 8.8ක් සහ සියයට 8.0ක් ලෙස වාර්තා විය. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2026 සැප්තැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 5.4හි සිට 2026 ඔක්තෝබර් මාසයේ දී සියයට 5.6ක් දක්වා ඉහළ ගියේය.

2026 සැප්තැම්බර් මාසයේ දී, ඉදිකිරීම් අංශය සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව ඉහළ යෑමක් වාර්තා කළේය.

2026 ඔක්තෝබර් 26 සිට 30 දක්වා කාලපරිච්ඡේදය තුළ දී, සෞඳි අරාබියට එරෙහිව අඛණ්ඩව එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර මධ්‍යයේ ඇති වූ සැපයුම් අවිනිශ්චිතතා හේතුවෙන් බොරතෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවති අතර, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. බොරතෙල් මිල ගණන් පිළිවෙළින්, බැරලයක් එ.ජ. ඩොලර් 110 සහ එ.ජ. ඩොලර් 100 ඉක්මවූ ඉහළ අගයන්වල පැවතුණි. සාම සාකච්ඡා පිළිබඳ වූ අපේක්ෂා අලුත් වීම හේතුවෙන් සතිය මැද දී බොරතෙල් මිල ගණන්වල තාවකාලික පහළ යෑමක් දක්නට ලැබුණ ද, කාලපරිච්ඡේදය අවසානය වන විට මිල ගණන් නීව්‍ර ලෙස ඉහළ ගියේය. සමස්තයක් ලෙස, සතියකට පෙර පැවැති මිල ගණන් සමඟ සැසඳීමේ දී, සලකා බලන කාලපරිච්ඡේදය අවසානය වනවිට බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. බොරතෙල් මිල ගණන් බැරලයකට පිළිවෙළින් එ.ජ. ඩොලර් 3.18කින් සහ එ.ජ. ඩොලර් 4.37කින් ඉහළ ගියේය.

මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2026 ඔක්තෝබර් මස 30 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 30කින් සියයට 11.23ක් දක්වා ඉහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පෙර සතියේ අග පැවති සියයට 9.00ට සාපේක්ෂව 2026 ඔක්තෝබර් මස 30 වන දින සියයට 9.04ක් දක්වා ඉහළ ගියේය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් පහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 384.90ක අනිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 392.68ක අනිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2026 ඔක්තෝබර් මස 30 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 2.32කින් දර්ශක අගය 20,142.33ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 2.37කින් දර්ශක අගය 5,746.40ක් දක්වා ඉහළ ගියේය.

රාජ්‍ය මූල්‍ය අංශය

සතිය තුළ දී ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ දෙකෙහිම භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතික පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි. පසුගිය වෙන්දේසියට සාපේක්ෂව ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතිකයන්ගේ ඉතා කුඩා ඉහළ යෑමක් වාර්තා වූ අතර ද්විතීයික වෙළඳපොළෙහි ඵලදා අනුපාතිකයන් පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 4.3ක පමණ පහළ යෑමක් දක්නට ලැබේ.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 2.3 ගුණයකට ආසන්න වේ. භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 2.2 ගුණයකට ආසන්න වේ.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 11.5කින් පමණ පහළ යෑමක් දක්නට ලැබේ.

විදේශීය අංශය

2026 වසරේ ඔක්තෝබර් 30වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6.8කින් අවප්‍රමාණය විය.

2026 වසරේ සැප්තැම්බර් මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 6,867ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වේ.

2026 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය, 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 5,174ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,912ක් දක්වා පුළුල් විය.

2026 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ අපනයන ආදායම 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 10,754ක් දක්වා සියයට 5.3කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගිය අතර, ආනයන වියදම 2025 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 18,666ක් දක්වා සියයට 21.3කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය.

අපනයන මිල ගණන් ඉහළ යෑම ඉක්මවා ආනයන මිල ගණන් ඉහළ ගිය බැවින්, 2026 වසරේ සැප්තැම්බර් මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 84.5ක් දක්වා සියයට 3.0කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය.


මූර්ත අංශය

1.1 මිල දර්ශක


ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100)	2025	2026	
	සැප්තැම්බර්	අගෝස්තු	සැප්තැම්බර්
මතුපිට උද්ධමනය - (ජා. පා. මි. ද.)	207.4	223.9	224.2
මාසික ප්‍රතිශත වෙනස %	0.1	0.2	0.1
වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස %	(0.9)	4.1	4.5
ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස %	2.1	8.1	8.1
මූලික උද්ධමනය - (ජා. පා. මි. ද.)	196.2	208.1	208.8
වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස %	0.7	3.5	3.9
ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස %	1.9	6.3	6.4

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100)	2025	2026	
	ඔක්තෝබර්	සැප්තැම්බර්	ඔක්තෝබර්
මතුපිට උද්ධමනය - (කො. පා. මි. ද.)	193.8	209.1	209.9
මාසික ප්‍රතිශත වෙනස %	0.1	0.1	0.4
වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස %	(1.2)	4.5	5.0
ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස %	2.1	8.0	8.3
මූලික උද්ධමනය - (කො. පා. මි. ද.)	181.4	190.9	191.6
වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස %	1.6	3.4	3.7
ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස %	2.2	5.4	5.6

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස



කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.2 මිල

1.2.1 පිටකොටුව වෙළඳපොළ

අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්)	තොග මිල ගණන්හි සාමාන්‍යය				සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය			
	පසුගිය වසර	පසුගිය මාසය	පසුගිය සතිය	මෙම සතිය	පසුගිය වසර	පසුගිය මාසය	පසුගිය සතිය	මෙම සතිය
සම්බා	240.00	233.00	233.00	233.00	250.00	240.00	240.00	240.00
රතු කැකුළු	208.00	173.00	175.00	175.00	215.00	190.00	192.00	190.00
බෝංචි	430.00	487.50	460.00	600.00	480.00	537.50	510.00	650.00
ගෝවා	64.00	225.00	410.00	490.00	112.00	275.00	460.00	540.00
කැරට්	104.00	175.00	206.00	340.00	154.00	225.00	256.00	390.00
තක්කාලි	126.00	350.00	620.00	620.00	176.00	400.00	670.00	670.00
වට්ටක්කා	64.00	195.00	284.00	268.00	104.00	245.00	340.00	326.00
පතෝල	252.00	250.00	400.00	480.00	302.00	300.00	450.00	530.00
වම්බටු	210.00	300.00	370.00	370.00	260.00	350.00	420.00	420.00
අමු මිරිස්	171.00	325.00	290.00	410.00	221.00	375.00	340.00	470.00
දෙහි	1,480.00	812.50	1,200.00	1,200.00	1,640.00	925.00	1,400.00	1,400.00
රතු ළූණු (දේශීය)	279.80	396.50	426.40	455.20	350.00	437.50	475.00	495.00
ලොකු ළූණු (ආනයනික)	136.20	271.00	263.20	276.60	172.00	292.25	285.40	305.40
අර්තාපල් (දේශීය)	215.00	333.25	252.40	282.60	308.00	385.75	313.80	351.60
වියළි මිරිස් (ආනයනික)	686.80	1,139.75	1,116.20	1,288.00	706.80	1,160.00	1,167.00	1,291.00
රතු පරිප්පු	234.40	238.00	238.00	240.00	270.00	253.00	255.00	255.00
බිත්තර-සුදු (එකක මිල)	24.00	31.88	34.60	33.60	24.50	33.83	35.85	35.90
පොල් (ගෙඩියක මිල)	170.00	150.00	157.60	167.40	187.00	160.00	168.00	173.00

1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්)	සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය			
	පසුගිය වසර	පසුගිය මාසය	පසුගිය සතිය	මෙම සතිය
සම්බා	241.80	223.25	224.20	225.40
සුදු කැකුළු	203.00	175.75	182.60	180.40
රතු කැකුළු	201.40	180.50	183.00	184.00
නාඩු	213.40	186.00	186.20	188.00

ලැනෝ. - ලැබී නොමැත.


1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්)	තොග මිල ගණන්හි සාමාන්‍යය	
	පසුගිය සතිය	මෙම සතිය
සම්බා	235.00	235.00
රතු කැකුළු	179.00	179.00
බෝංචි	392.00	459.00
ගෝවා	349.00	470.00
කැරට්	238.00	380.00
තක්කාලි	469.00	500.00
වට්ටක්කා	220.00	221.00
පතෝල	252.00	279.00
වම්බටු	288.00	319.00
අළු කෙසෙල්	140.00	157.00
රතු ළූණු (දේශීය)	378.00	364.00
රතු ළූණු (ආනයනික)	365.00	405.00
ලොකු ළූණු (ආනයනික)	255.00	300.60
අර්තාපල් (දේශීය)	211.00	225.00
අර්තාපල් (ආනයනික)	154.60	174.50
වියළි මිරිස් (ආනයනික)	1,157.00	1,269.00
පොල් (ගෙඩියක මිල)	139.20	143.80

1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්)	සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය	
	පසුගිය සතිය	මෙම සතිය
සුදු නාඩු	230.00	230.00
රතු කැකුළු	190.00	190.00
බෝංචි	700.00	720.00
ගෝවා	464.00	576.00
කැරට්	356.00	492.00
තක්කාලි	880.00	760.00
වට්ටක්කා	292.00	380.00
පතෝල	444.00	552.00
වම්බටු	592.00	552.00
අමු මිරිස්	600.00	820.00
රතු ළූණු (දේශීය)	700.00	700.00
ලොකු ළූණු (ආනයනික)	ලැනෝ.	ලැනෝ.
අර්තාපල් (දේශීය)	440.00	472.00
අර්තාපල් (ආනයනික)	220.00	236.00
වියළි මිරිස් (ආනයනික)	1,240.00	1,240.00
රතු පරිප්පු	280.00	280.00
සුදු සීනි	240.00	240.00
බිත්තර- සුදු (එකක මිල)	37.80	38.00
පොල් (ගෙඩියක මිල)	200.00	200.00

නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල



1.2.5 මාළු වෙළඳපොළ


අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්)	පැලියගොඩ		මීගමුව				නාරාහේන්පිට	
	තොග මිල ගණන්හි සාමාන්‍යය		තොග මිල ගණන්හි සාමාන්‍යය		සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය		සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය	
	පසුගිය සතිය	මෙම සතිය	පසුගිය සතිය	මෙම සතිය	පසුගිය සතිය	මෙම සතිය	පසුගිය සතිය	මෙම සතිය
කෙලවල්ලා	1,320.00	1,380.00	970.00	1,075.00	1,760.00	1,775.00	2,435.00	2,504.00
බලයා	770.00	860.00	1,000.00	883.33	1,320.00	1,180.00	1,200.00	1,100.00
සාලයා	326.00	575.00	368.00	532.50	534.00	780.00	608.00	764.00
හුරුල්ලා	680.00	950.00	585.00	942.50	832.50	1,207.50	1,052.00	1,240.00

ලැනෝ. - ලැබී නොමැත.

1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

අයිතමය	වාර්ෂික		දෙවන කාර්තුව	
	2024(අ)(ආ)	2025 (ආ)	2025(අ)(ආ)	2026 (ආ)
කෘෂිකාර්මික	0.6	1.4	2.5	(2.3)
කාර්මික	11.1	7.8	5.7	7.3
සේවා	2.4	3.3	4.0	2.7
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර	10.9	12.3	13.3	11.9
දළ දේශීය නිෂ්පාදිතය	5.0	5.0	5.0	4.2

(අ) සංශෝධිත
(ආ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

අයිතමය	අගෝස්තු		% වෙනස
	2025(අ)	2026(අ)	
තේ (කි.ග්‍රෑ. මිලියන)	19.7	19.0	(3.7)
රබර් (කි.ග්‍රෑ. මිලියන)	6.1	6.0	(2.2)
	ජූලි - අගෝස්තු (ආ)		% වෙනස
	2025 (අ)	2026 (අ)	
පොල් (ගෙඩි මිලියන)	508.0	499.0	(1.8)

(අ) තාවකාලික
(ආ) පොල් පර්යේෂණ ආයතනය වෙතින් ලබාගත් පෙර වර්ෂවල දත්ත මත පදනම්ව 2025 වර්ෂයට අදාළ දත්ත සංශෝධනය කරන ලදී.




මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් සංවර්ධන අධිකාරිය
පොල් පර්යේෂණ ආයතනය

1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

අයිතමය	අගෝස්තු		% වෙනස
	2025 (ආ)	2026 (ආ)	
කාර්මික නිෂ්පාදන දර්ශකය	98.4	99.7	1.3
ආහාර නිෂ්පාදන	93.0	100.9	8.5
ඇඟලුම් නිෂ්පාදන	109.7	98.1	(10.6)
අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන	118.5	123.0	3.8
අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	100.1	110.1	10.0
රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	80.5	82.1	2.0
රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන	86.8	71.8	(17.3)
පාන වර්ග	128.8	125.7	(2.4)

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ආ) තාවකාලික



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන	2025		2026	
	අගෝ	සැප්	අගෝ	සැප්
දර්ශකය	55.2	55.4	53.0	53.0


ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා	2025		2026	
	අගෝ	සැප්	අගෝ	සැප්
ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය	68.9	58.7	65.6	60.5

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම්	2025		2026	
	අගෝ	සැප්	අගෝ	සැප්
සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය	61.1	67.6	59.4	57.8

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක බරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සෑසඳිය හැකිය.








1.7 සේවා නියුක්තිය [අ]

අයිතමය	2025 [ආ]	2025 කාර්තු:2 [ඇ]	2026 කාර්තු:2
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය	49.4	49.1	50.0
සේවා වියුක්ති අනුපාතිකය	3.9	3.7	4.0

අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන් [ඇ] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)


	2025	2025 කාර්තු:2 [ඇ]	2026 කාර්තු:2
කෘෂිකර්මාන්ත	23.9	25.8	23.4
කර්මාන්ත	26.2	25.6	27.3
සේවා	49.8	48.6	49.2



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


1.8 වැටුප් ප්‍රමාණ දර්ශක

අයිතමය	2025 සැප්	2026 සැප්	වෙනස %
රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික	183.4	192.6	5.0
අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික	193.3	213.3	10.3
කෘෂිකර්මාන්ත	194.0	214.2	10.4
කර්මාන්ත	193.6	215.5	11.3
සේවා	192.0	206.7	7.7




1.9 බොරතෙල් සාමාන්‍ය මිල

මාසය	2025 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල)	2025 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල)	2025 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඉ) (ඊ)	2026 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල)	2026 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල)	2026 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඉ) (ඊ)
ජනවාරි	77.90	74.77	76.14	63.96	59.60	68.11
පෙබරවාරි	75.12	71.37	76.32	69.16	64.33	66.67
මාර්තු	71.41	67.88	83.33	99.74	91.72	66.48
අප්‍රේල්	66.96	63.54	83.47	102.73	97.55	73.19
මැයි	63.96	60.86	75.75	104.92	99.51	136.66
ජූනි	70.13	68.14	70.79	85.74	82.81	117.14
ජූලි	69.29	66.94	66.70	83.48	78.28	104.02
අගෝස්තු	67.47	64.23	66.84	87.94	82.35	87.92
සැප්තැම්බර්	67.63	63.69	73.51	101.84	95.40	86.62
ඔක්තෝබර්	64.25	60.33	72.86	107.52	96.15	
නොවැම්බර්	63.69	59.51	72.59			
දෙසැම්බර්	61.81	58.02	68.40			
වාර්ෂික සාමාන්‍යය	**68.25**	**64.90**	**73.22**			




දිනය	2025		2026	
ඔක් 23	64.05	59.88	114.56	100.46
ඔක් 24	65.55	61.36	-	-
ඔක් 25	-	-	-	-
ඔක් 26	-	-	114.88	101.33
ඔක් 27	66.05	61.59	114.72	100.89
ඔක් 28	65.72	61.36	115.56	101.07
ඔක් 29	64.60	60.33	114.49	101.70
ඔක් 30	64.72	60.27	117.74	104.83



මූලයන්: බ්ලූම්බර්ග් නොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

1.10 දෛනික විදුලිබල උත්පාදනය

	2026-10-26	2026-10-27	2026-10-28	2026-10-29
උපරිම ඉල්ලුම (මෙ. වො.)	2,595.10	2,781.90	2,777.60	2,850.80
මුළු උත්පාදනය (ගි. වො. පැ.)	49.96	53.23	54.13	54.61
ජල (ගි. වො. පැ.)	27.54	28.06	27.39	27.11
ගල් අඟුරු (ගි. වො. පැ.)	12.76	10.92	11.27	10.50
තෙල් (ගි. වො. පැ.)	6.25	5.34	6.65	7.86
සුළං (ගි. වො. පැ.)	0.73	1.07	2.42	1.60
සූර්ය (ගි. වො. පැ.)	2.31	7.50	6.02	7.09
ජෛව ස්කන්ධය (ගි. වො. පැ.)	0.38	0.34	0.39	0.45



මූලය: නෑෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්.) සමාගම


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) කාර්තු හතරේ සාමාන්‍යය මත දත්ත පදනම් වේ. (ඇ) සංශෝධිත
(ඈ) ජාත්‍යන්තර සම්මිත කාර්මික වර්ගීකරණයේ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඉ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී/ අධිභාර ආදිය ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ.
(ඊ) තාවකාලික

මුදල් අංශය

2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

ප්‍රතිපත්ති පොලී අනුපාතිකය	වසරකට පෙර	සතියකට පෙර	මෙම සතිය
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (අ)	7.75	8.75	8.75
නිත්‍ය පහසුකම් අනුපාතික (අ)			
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	7.25	8.25	8.25
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	8.25	9.25	9.25
ඒක්ෂණ මුදල් වෙළඳපොළ			
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිය අවසානයට)	7.89	9.00	9.04
භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ) (ආ)			
දින 91	7.52	9.32	9.34
දින 182	7.90	9.44	9.44
දින 364	8.04	9.95	9.95
බලපත්‍රලාභී වාණිජ බැංකු			
බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR)	8.31	10.93	11.23

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය



	2025 සැප්තැම්බර්	2026 අගෝස්තු	2026 සැප්තැම්බර්
ඉහිරිකිරීමේ තැන්පතු (ඇ)	0.25 - 9.00	0.10 - 9.00	0.10 - 9.00
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	2.50 - 12.00	2.50 - 12.00	2.50 - 12.50
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR)	6.80	7.52	7.62
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR)	8.34	9.34	9.40
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR)	5.89	7.76	7.79
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR)	6.46	8.31	8.52
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR)	11.37	12.59	12.66
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR)	10.27	12.65	12.65
බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR)	11.48	12.67	12.82
බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR)	10.77	13.08	13.17

ජාතික ඉතිරිකිරීමේ බැංකුව	2025 සැප්තැම්බර්	2026 අගෝස්තු	2026 සැප්තැම්බර්
ඉතිරිකිරීමේ තැන්පතු	3.00	3.00	3.00
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	6.75	7.25	7.25

භාණ්ඩාගාර බැදුම්කර වෙන්දේසිය (ආ) (2026 ඔක්තෝබර් 29)	කල්පිරෙන දිනය		
	2030 මැයි 15 (අවුරුදු 3 මාස 6)	2034 ඔක්තෝබර් 15 (අවුරුදු 7 මාස 11)	2036 අගෝස්තු 15 (අවුරුදු 9 මාස 9)
පොලී අනුපාතිකය	11.00	11.70	10.85
බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය	11.44	12.61	12.85


බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව

	සතියකට පෙර	මෙම සතිය		සතියකට පෙර	මෙම සතිය
ලංකා බැංකුව	11.28	11.20	කාර්ගිල්ස් බැංකුව (ඇ)	13.61	13.61
මහජන බැංකුව	11.15	10.93	එච්එස්බීසී බැංකුව	10.30	10.46
හැටන් නැෂනල් බැංකුව	11.34	11.14	ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව	10.38	10.16
කොමර්ෂල් බැංකුව	11.21	11.42	සිටි බැංකුව	8.86	9.59
සම්පත් බැංකුව	11.80	11.76	ඩොයිෂ් බැංකුව	10.08	10.02
සෙලාන් බැංකුව	11.33	11.35	හබීබ් බැංකුව	10.88	10.88
යූනියන් බැංකුව	13.29	13.97	ඉන්දියන් බැංකුව	12.75	12.97
පෑන් ඒෂියා බැංකුව	12.88	13.27	ඉන්දියන් ඕවර්සීස් බැංකුව	10.88	10.88
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	11.21	11.23	එම්සීබී බැංකුව (ඇ)	10.88	10.88
ඩීඑෆ්සීසී බැංකුව	12.70	12.42	ඉන්දීය රාජ්‍ය බැංකුව	10.34	11.84
එන්ඩීබී බැංකුව	12.00	12.39	පබ්ලික් බැංකුව	11.49	10.99
අමානා බැංකුව (ඇ)	14.37	14.37	බෑන්ක් ඔෆ් චයිනා (ඇ)	10.50	10.50

(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. පදනම් අංක ± 50 ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කෙරේ.
(ආ) රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයෙන් ඵලදා අනුපාතික ලබා ගනු ලැබේ.
(ඇ) සමහර බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වැරදි වාර්තාකරණයන් යටතේ වාර්තා කරන ලද දත්ත නිවැරදි කිරීමෙන් අනතුරුව, 2026 ජනවාරි සිට ජූලි මාස වලට අදාළ අවම ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය සංශෝධනය කර ඇත.
(ඈ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආඝන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

2.2 මුදල් සැපයුම


	රු. බිලියන			වාර්ෂික වෙනස (%)		
	අගෝස්තු 2025	ජූලි 2026 (අ)	අගෝ 2026 (අා)	අගෝ 2025	ජූලි 2026 (අ)	අගෝ 2026 (අා)
සංචිත මුදල්	1,712.2	1,894.4	1,914.3	15.2	12.2	11.8
පටු මුදල් සැපයුම (M1)	2,123.1	2,341.2	2,391.3	17.9	11.8	12.6
පුළුල් මුදල් සැපයුම (M2)	13,512.8	14,904.8	15,036.8	10.5	11.2	11.3
ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b)	15,367.9	17,043.5	17,140.5	10.7	12.1	11.5
බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්(අා)	999.4	1,564.6	1,674.1	240.7	78.1	67.5
මුදල් අධිකාරීන්	514.8	908.4	1,076.5	611.2	105.8	109.1
වාණිජ බැංකු	484.6	656.2	597.6	23.0	50.2	23.3
දේශීය බැංකු ඒකක (DBUs)	(416.0)	(473.9)	(464.0)	(76.3)	(28.3)	(11.5)
අක්වෙරළ බැංකු ඒකක (OBUs)	900.5	1,130.2	1,061.6	42.9	40.1	17.9
බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්(අා)	14,368.6	15,479.0	15,466.4	5.8	8.0	7.6
රජයේ ණය ගැනීම් (ශුද්ධ)	8,381.4	7,820.2	7,737.0	4.0	(8.4)	(7.7)
මහ බැංකුව	1,862.0	1,550.0	1,435.6	6.1	(16.2)	(22.9)
වාණිජ බැංකු	6,519.4	6,270.2	6,301.4	3.4	(6.2)	(3.3)
දේශීය බැංකු ඒකක (DBUs)	6,448.7	6,188.0	6,220.8	4.9	(6.5)	(3.5)
අක්වෙරළ බැංකු ඒකක (OBUs)	70.7	82.3	80.6	(55.3)	17.3	14.0
රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය	617.8	486.0	479.8	(5.2)	(19.5)	(22.3)
දේශීය බැංකු ඒකක (DBUs)	564.4	407.2	400.5	(5.8)	(26.0)	(29.0)
අක්වෙරළ බැංකු ඒකක (OBUs)	53.3	78.8	79.2	2.0	48.0	48.5
පෞද්ගලික අංශයට දෙන ලද ණය	9,284.4	11,450.6	11,556.3	20.5	26.4	24.5
දේශීය බැංකු ඒකක (DBUs)	8,688.3	10,860.3	10,999.0	21.9	28.5	26.6
අක්වෙරළ බැංකු ඒකක (OBUs)	596.1	590.4	557.3	3.0	(3.0)	(6.5)
අනෙකුත් අයිතම (ශුද්ධ)	(3,915.1)	(4,277.9)	(4,306.7)	(38.1)	(10.5)	(10.0)




2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

	2026-10-22	2026-10-29
සංචිත මුදල් (රුපියල් මිලියන)	1,942,622.11	1,936,638.61

	2026-10-23	2026-10-30
සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන)	1,626,269.44	1,622,422.95





2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

ඒක්ෂණ මුදල් වෙළඳපොළ	2026-10-26	2026-10-27	2026-10-28	2026-10-29	2026-10-30
බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට)	9.02	9.02	9.02	9.03	9.04
දළ වටිනාකම (රුපියල් බිලියන)	36.95	39.96	37.57	30.62	25.15

වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම්	2026-10-26	2026-10-27	2026-10-28	2026-10-29	2026-10-30
බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට)	9.07	9.07	9.08	9.09	9.10
දළ වටිනාකම (රුපියල් බිලියන)	61.15	59.55	55.45	57.62	72.30

2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

	2026-10-26	2026-10-27	2026-10-28	2026-10-29	2026-10-30
ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන)	2,492.6	2,492.6	2,492.6	2,492.6	2,492.6
ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන)	1,504.2	1,502.9	1,503.9	1,503.0	1,500.3

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් විසින් වැරදි වර්ගීකරණයන් යටතේ වාර්තා කරන ලද දත්ත නිවැරදි කිරීම හේතුවෙන් මුදල් සමස්තයෙහි සංයුතිය 2026 ජනවාරි-ජූලි කාලසීමාව සඳහා සංශෝධනය කරන ලද අතර, ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) නොවෙනස්ව පැවතුණි.
(අා) තාවකාලික
(අෑ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට (M2b) අදාළව

2.6 විවට වෙළඳපොළ කටයුතු

අයිතමය	2026-10-26	2026-10-27	2026-10-28	2026-10-29	2026-10-30
කෙටි කාලීන වෙන්දේසි					
පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන)	40.00	40.00	40.00	40.00	50.00
පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
කාල සීමාව (දින ගණන)	1	1	1	1	3
ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන)	31.75	26.75	40.00	37.00	10.70
පිළිගත් ප්‍රමාණය (රු. බිලියන)	31.75	26.75	40.00	37.00	10.70
අවම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	8.75	8.75	8.75	8.75	8.75
උපරිම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	8.75	8.75	8.75	8.75	8.75
බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	8.75	8.75	8.75	8.75	8.75
ස්ථිර පදනම මත වෙන්දේසි					
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන)	-	-	-	-	-
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන)	-	-	-	-	-
පියවීමේ දිනය	-	-	-	-	-
පරිණත වන දිනය	-	-	-	-	-
කාල සීමාව (දින ගණන)	-	-	-	-	-
ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
පිළිගත් ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
අවම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
උපරිම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
දිගු කාලීන වෙන්දේසි					
පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන)	20.00	-	-	30.00	-
පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
පියවීමේ දිනය	2026.10.27	-	-	2026.10.30	-
පරිණත වන දිනය	2026.11.27	-	-	2026.11.30	-
කාල සීමාව (දින ගණන)	31	-	-	31	-
ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන)	6.00	-	-	10.00	-
පිළිගත් ප්‍රමාණය (රු. බිලියන)	0.00	-	-	10.00	-
අවම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	9.22	-
උපරිම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	9.24	-
බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	9.23	-
ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි					
පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
පියවීමේ දිනය	-	-	-	-	-
පරිණත වන දිනය	-	-	-	-	-
කාල සීමාව (දින ගණන)	-	-	-	-	-
ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන)	-	-	-	-	-
අවම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
උපරිම පිළිගත් අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පෙ.අ. සියයට)	-	-	-	-	-
නිත්‍ය පහසුකම					
නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන)	76.64	93.75	84.15	84.34	121.03
නිත්‍ය ණය පහසුකම (රු. බිලියන)	0.61	0.00	5.60	5.00	0.05
සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)	**107.77**	**120.50**	**118.55**	**116.34**	**131.68**
සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]	**378.77**	**391.50**	**389.55**	**387.34**	**392.68**

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම් /ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි .

2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු


2.7.1 ණය කාඩ්පත්[අ]


	2025 දෙසැම්බර්	2026 ජූලි	2026 අගෝස්තු[ආ]
මුළු සක්‍රීය කාඩ්පත් ගණන	2,166,186	2,280,120	2,297,783
දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි)	8,915	7,606	7,475
ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්)	2,157,271	2,272,514	2,290,308
නොපියවූ ශේෂය (රු. මිලියන)[අඅ]	189,706	209,189	213,425

2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[ඇ]

	2025 දෙසැම්බර්	2026 ජූලි	2026 අගෝස්තු[ආ]
සමස්ත නිකුතුව - සමුච්චිත[ඉ][ඊ] (රු. බිලියන)	5.4	5.7	6.6
නොපියවූ (කාලපරිච්ඡේදය අවසානය වනවිට)	1.4	3.6	3.6


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද
(ආ) තාවකාලික
(ඇ) ණය කාඩ්පත්හි නොපියවූ ශේෂයට අදාළව දේශීය හා ගෝලීය වර්ගීකරණය යටතේ දත්ත ප්‍රකාශයට පත් කිරීම 2026 අගෝස්තු 21 දින සිට අත්හිටුවන ලදී.
(අඅ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඉ) වසරේ මේ දක්වා එකතුව
(ඊ) සමස්ත වාණිජ පත්‍රිකා නිකුතුව තුල අලුත් කිරීමේ නිකුත් කිරීම් ද ඇතුළත් වේ.





2.8 කොටස් වෙළඳපොළ

	2025-10-30	2026-10-23	2026-10-30
සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) (ASPI)	22,839.53	19,684.91	20,142.33
එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) (S&P SL20)	6,202.71	5,613.63	5,746.40
දෛනික පිරිවැටුම (රු. මිලියන)	7,781.53	825.13	958.58
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන)	8,138.73	7,107.02	7,256.45
විදේශීය මිලදී ගැනීම් (රු. මිලියන)	212.98	55.14	29.72
විදේශීය විකිණුම් (රු. මිලියන)	1,070.22	17.55	102.05
ශුද්ධ විදේශ මිලදී ගැනීම් (රු. මිලියන)	(857.23)	37.59	(72.33)




මූලය: කොළඹ කොටස් වෙළඳපොළ

රාජ්‍ය මූල්‍ය අංශය

3.1 රාජ්‍ය මූල්‍ය කටයුතු (රු. බිලියන)

ශීර්ෂය	2025 ජන. - අගෝ.	2026 (අ) ජන. - අගෝ.
ආදායම් සහ ප්‍රදාන	3,301.46	4,002.32
ආදායම	3,294.74	3,998.29
බදු ආදායම	3,068.50	3,683.53
බදු නොවන ආදායම	226.24	314.76
ප්‍රදාන	6.72	4.03
වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්	3,712.49	3,966.91
පුනරාවර්තන	3,381.31	3,531.05
ප්‍රාග්ධන වියදම් සහ ආපසු ගෙවීම් අඩු කළ පසු ශුද්ධ ණයදීම්	331.18	435.87
ප්‍රාථමික ශේෂය	1,276.54	1,644.60
සමස්ත අයවැය ශේෂය	(411.03)	35.40


රාජ්‍ය ආදායම සහ වියදම
ජනවාරි - අගෝස්තු



3.2 මධ්‍යම රජයේ නොපියවූ ණය (රු. බිලියන)(ආ)

ශීර්ෂය	2025 (අ)(ඇ) අවසානයට	2026 (අ)(ඇ) ජූනි අවසානයට
සමස්ත දේශීය ණය(ඈ)	18,675.32	18,804.64
එයින්; භාණ්ඩාගාර බිල්පත්	3,136.29	2,361.73
භාණ්ඩාගාර බැඳුම්කර	15,427.75	15,943.67
සමස්ත විදේශීය ණය(ඉ)(ඊ)	11,319.36	12,473.79
මධ්‍යම රජයේ සමස්ත නොපියවූ රාජ්‍ය ණය	29,994.69	31,278.43

මධ්‍යම රජයේ ණය
2026 මාර්. අවසානයේ සිට 2026 ජූනි අවසානය දක්වා



මූලයන් : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (මුදල් අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන මගින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය, ණය සංඛ්‍යාලේඛන සඳහා නිල මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. දත්ත අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබෙන දත්ත මත පදනම්ව, 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව මධ්‍යම රජයේ නොපියවූ ණය දත්ත (3.2 සංඛ්‍යා සටහන) සම්පාදනය කර ඇත.


3.3 රාජ්‍ය සුරැකුම්පත් - 2026 ඔක්තෝබර් 29 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික

3.3.1 භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ඵලදා අනුපාතික


සුරැකුම්පත	පරිණත කාලය	ප්‍රාථමික වෙළඳපොළ (ඇ) %		ද්විතීයික වෙළඳපොළ (ඈ) %			
				මෙම සතිය			පසුගිය සතියේ
		පසුගිය සතිය	මෙම සතිය	මිලට ගැනීම්	විකුණුම්	සාමාන්‍යය	සාමාන්‍යය
භාණ්ඩාගාර බිල්පත්	දින 91	9.32	9.34	9.29	9.13	9.21	9.22
	දින 182	9.44	9.44	9.50	9.34	9.42	9.43
	දින 364	9.95	9.95	9.99	9.82	9.91	9.91
භාණ්ඩාගාර බැඳුම්කර	< වසර 02	-	-	10.47	10.27	10.37	10.38
	< වසර 03	-	-	11.02	10.84	10.93	10.91
	< වසර 04	-	11.44	11.47	11.32	11.40	11.39
	< වසර 05	-	-	11.69	11.53	11.61	11.59
	< වසර 06	-	-	11.92	11.72	11.82	11.78
	< වසර 08	-	12.61	12.19	12.01	12.10	12.01
	< වසර 10	-	12.85	12.43	12.20	12.31	12.24
	< වසර 15	-	-	12.57	12.26	12.42	12.37
	< වසර 20	-	-	12.78	12.38	12.58	12.50

මූලය : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

භාණ්ඩාගාර බිල්පත් (ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික)



භාණ්ඩාගාර බැඳුම්කර (ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික)



(අ) තාවකාලික
(ආ) 2014 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.
(ඇ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු ගෙවීමට නියමිත පොළී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.
(ඈ) මධ්‍යම රජයේ නොපියවූ ණය යටතට අවශෝෂණය කරන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවැති භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ ණය ඇතුළත් වේ.
(ඉ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළ නොගෙවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.
(ඊ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය වාර්තාකරණ හා කළමනාකරණ පද්ධතියෙන් ලබා ගත් දත්ත මත පදනම්ව විදේශීය ණය දත්ත සකස් කර ඇත.
(උ) 2026 ඔක්තෝබර් 29 දිනෙන් අවසන් වූ සතිය තුළ සිදු වූ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු (ඌ) ද්විතීයික වෙළඳපොළ තුළ ඉදිරිපත්කල ඵලදා අනුපාතිකයන්ගේ සාමාන්‍ය

3.3.2 ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර

සුරැකුම්පත	පරිණත දිනය	විස්තරය	ද්විතීයික වෙළඳපොළ %	
			පසුගිය සතිය	මෙම සතිය
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	2028 අප්‍රේ. 15	උපචිත පොලී සඳහා 2028 කල්පිරෙන 4.00% බැඳුම්කර	6.43	6.24
	2030 ජන. 15	2030 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධනය හා බැඳුනු බැඳුම්කර	2.56	2.38
	2033 මාර්. 15	2033 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධනය හා බැඳුනු බැඳුම්කර	5.19	5.06
	2035 ජූනි 15	2035 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත යහපාලනය හා බැඳුනු බැඳුම්කර	9.58	9.43
	2036 මැයි 15	2036 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධනය හා බැඳුනු බැඳුම්කර	5.70	5.52
	2038 පෙබ. 15	2038 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධනය හා බැඳුනු බැඳුම්කර	6.29	6.11
	2038 ජූනි 15	2038 කල්පිරෙන ක්‍රමයෙන් වැඩිවන කූපන් පොලී අනුපාතික සහිත එ.ජ.ඩොලර් බැඳුම්කර	6.64	6.66

3.4 රාජ්‍ය සුරැකුම්පත් - 2026 ඔක්තෝබර් 29 දිනෙන් අවසන් වූ සතියට ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු සාරාංශය

අයිතමය	ප්‍රමාණය (රු. මිලියන)	
	පසුගිය සතිය	මෙම සතිය
නොපියවූ රාජ්‍ය ණය සුරැකුම්පත්		
භාණ්ඩාගාර බිල්පත්	2,376,525	2,351,718
භාණ්ඩාගාර බැඳුම්කර	16,577,276	16,577,276
එයින් අනේවාසිකයින් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර	199,542	190,937
එකතුව	18,953,801	18,928,994

ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම් (අ)	ප්‍රමාණය (රු. මිලියන)	
	පසුගිය සතිය	මෙම සතිය
භාණ්ඩාගාර බිල්පත්		
පළමු අදියර, බහුමිල තරඟකාරී වෙන්දේසිය		
ඉදිරිපත් කළ ප්‍රමාණය	100,000	100,000
ලැබුණු ලංසු ප්‍රමාණය	186,002	225,082
පිළිගත් ලංසු ප්‍රමාණය	80,611	86,483
දෙවන අදියර, තරඟකාරී නොවන වෙන් කිරීම		
පිළිගත් ප්‍රමාණය	2,282	2,500
භාණ්ඩාගාර බැඳුම්කර		
පළමු අදියර, දෙවන අදියර, තෙවන අදියර		
ඉදිරිපත් කළ ප්‍රමාණය	-	100,000
ලැබුණු ලංසු ප්‍රමාණය	-	219,113
පිළිගත් ලංසු ප්‍රමාණය	-	100,000
සෘජු නිකුතු කවුළුව		
පිළිගත් ප්‍රමාණය	-	-

ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්	ප්‍රමාණය (රු. මිලියන)	
	පසුගිය සතිය	මෙම සතිය
භාණ්ඩාගාර බිල්පත්		
හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්)	82,539	68,308
ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්)	523,396	290,873
භාණ්ඩාගාර බැඳුම්කර		
හිමිකම මත පැවරූ ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්)	377,856	350,273
ප්‍රති මිලදී ගැනුම් ගනුදෙනු (විකුණුම් / මිලදී ගැනුම්)	2,196,018	2,104,434

මූලයන් : රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ඩිලමිබර්ග් තොරතුරු සේවය

(අ) සාමාන්‍ය නිකුතු ක්‍රියාවලිය යටතේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලට පමණක් සීමා වේ.

3.5 දිවී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බිල්පත්) - 2026 ඔක්තෝබර් 30

පරිණතියට ඇති ඉතිරි කාලය	සාමාන්‍ය ගැනුම් මිල	ඵලදා අනුපාතික %	සාමාන්‍ය විකුණුම් මිල	ඵලදා අනුපාතික %	ගැනුම් හා විකුණුම් මිල පරතරය
1-7 දින	99.8268	9.02	99.8290	8.91	0.0022
මාස 1	99.2561	9.09	99.2662	8.97	0.0102
මාස 2	98.5077	9.19	98.5266	9.07	0.0189
මාස 3	97.7219	9.33	97.7598	9.17	0.0380
මාස 4	96.9884	9.42	97.0369	9.26	0.0485
මාස 5	96.2446	9.47	96.3066	9.31	0.0621
මාස 6	95.4631	9.51	95.5384	9.34	0.0752
මාස 7	94.7551	9.59	94.8494	9.41	0.0943
මාස 8	94.0143	9.66	94.1201	9.48	0.1057
මාස 9	93.2516	9.76	93.3529	9.60	0.1013
මාස 10	92.5002	9.84	92.6017	9.69	0.1015
මාස 11	91.7544	9.91	91.8647	9.77	0.1103
මාස 12	90.9091	10.00	91.0539	9.83	0.1449

3.6 දිවී පාර්ශ්වීය මිල ගණන් (භාණ්ඩාගාර බැඳුම්කර) - 2026 ඔක්තෝබර් 30

භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය	පරිණත කාලය (වසර ගණනින්)	පරිණත දිනය (වර්ෂය/මාසය/දිනය)	පරිණතියට ඇති දින ගණන	සාමාන්‍ය ගැනුම් මිල	ඵලදා අනුපාතික %	සාමාන්‍ය විකුණුම් මිල	ඵලදා අනුපාතික %	ගැනුම් හා විකුණුම් මිල පරතරය
11.25%2026A	3	2026 දෙසැම්බර් 15	46	100.1741	9.45	100.1977	9.27	0.0236
11.40%2027A	8	2027 ජනවාරි 15	77	100.2886	9.67	100.3409	9.43	0.0523
18.00%2027A	5	2027 මැයි 1	183	103.8986	9.90	104.0268	9.64	0.1283
11.75%2027A	10	2027 ජූනි 15	228	101.0430	9.94	101.2272	9.64	0.1842
07.80%2027A	7	2027 අගෝස්තු 15	289	98.2627	10.10	98.4899	9.79	0.2272
20.00%2027A	5	2027 සැප්තැම්බර් 15	320	108.0425	10.12	108.2105	9.93	0.1680
10.30%2027A	8	2027 ඔක්තෝබර් 15	350	100.0653	10.22	100.2728	9.98	0.2076
11.25%2027A	10	2027 දෙසැම්බර් 15	411	100.9991	10.26	101.2428	10.03	0.2437
18.00%2028A	6	2028 ජනවාරි 15	442	108.3904	10.39	108.5822	10.23	0.1918
10.75%2028B	3	2028 පෙබරවාරි 15	473	100.3503	10.43	100.6174	10.20	0.2671
10.75%2028A	10	2028 මාර්තු 15	502	100.3059	10.49	100.5324	10.31	0.2265
09.00%2028B	15	2028 මැයි 1	549	97.9010	10.54	98.2337	10.30	0.3327
09.00%2028A	15	2028 ජූලි 1	610	97.5850	10.60	97.9946	10.32	0.4096
11.50%2028A	13	2028 සැප්තැම්බර් 1	672	101.2207	10.73	101.6779	10.45	0.4572
11.00%2028A	4	2028 ඔක්තෝබර් 15	716	100.3015	10.82	100.6046	10.64	0.3030
11.50%2028B	5	2028 දෙසැම්බර් 15	777	101.1785	10.85	101.4993	10.68	0.3209
13.00%2029A	15	2029 ජනවාරි 1	794	103.9146	10.91	104.3504	10.68	0.4358
13.00%2029B	15	2029 මැයි 1	914	104.3997	10.94	104.8412	10.74	0.4415
11.75%2029A	5	2029 ජූනි 15	959	101.5512	11.04	101.9322	10.87	0.3809
20.00%2029A	7	2029 ජූලි 15	989	120.4270	11.04	120.9388	10.85	0.5117
11.00%2029A	7	2029 සැප්තැම්බර් 15	1,051	99.6917	11.12	100.2572	10.88	0.5655
10.35%2029A	4	2029 ඔක්තෝබර් 15	1,081	97.9584	11.18	98.3850	11.00	0.4266
11.00%2029B	5	2029 දෙසැම්බර් 15	1,142	99.5105	11.18	100.1276	10.94	0.6171
09.50%2030A	4	2030 මාර්තු 1	1,218	94.9560	11.35	95.3140	11.21	0.3579
11.00%2030A	15	2030 මැයි 15	1,293	98.8317	11.41	99.2086	11.27	0.3769
09.75%2030A	5	2030 ජූලි 1	1,340	94.8600	11.50	95.2331	11.36	0.3731
10.00%2030A	4	2030 අගෝස්තු 1	1,371	95.3390	11.55	95.8093	11.39	0.4703
11.00%2030B	6	2030 ඔක්තෝබර් 15	1,446	98.1430	11.59	98.6665	11.42	0.5235
11.60%2031A	5	2031 පෙබරවාරි 1	1,555	99.5109	11.74	99.9701	11.60	0.4592
11.25%2031A	12	2031 මාර්තු 15	1,597	98.3106	11.75	98.8510	11.58	0.5404
18.00%2031A	9	2031 මැයි 15	1,658	121.3061	11.80	121.9537	11.64	0.6476
12.00%2031A	10	2031 දෙසැම්බර් 1	1,858	100.4656	11.87	101.0070	11.73	0.5413
08.00%2032A	20	2032 ජනවාරි 1	1,889	85.0223	11.96	85.6877	11.77	0.6655
18.00%2032A	10	2032 ජූලි 1	2,071	124.1217	12.00	125.0979	11.79	0.9762
09.00%2032A	20	2032 ඔක්තෝබර් 1	2,163	87.3049	12.06	87.9877	11.88	0.6828
11.50%2032A	8	2032 දෙසැම්බර් 15	2,238	97.5213	12.08	98.3897	11.87	0.8684
11.20%2033A	15	2033 ජනවාරි 15	2,269	95.6557	12.21	96.4692	12.01	0.8135
09.00%2033A	20	2033 ජූනි 1	2,406	85.5076	12.27	86.5831	12.00	1.0755
13.25%2033A	20	2033 ජූලි 1	2,436	104.1589	12.31	105.0361	12.12	0.8771
09.00%2033B	20	2033 නොවැම්බර් 1	2,559	84.7440	12.31	85.8385	12.05	1.0945
13.25%2034A	20	2034 ජනවාරි 1	2,620	103.8501	12.41	104.6678	12.24	0.8177
10.75%2034A	8	2034 ජූනි 15	2,785	91.6937	12.46	92.4392	12.30	0.7455
10.25%2034A	15	2034 සැප්තැම්බර් 15	2,877	88.8585	12.51	89.6880	12.33	0.8295
11.70%2034A	8	2034 ඔක්තෝබර් 15	2,907	95.8112	12.54	96.6164	12.38	0.8053
11.50%2035A	20	2035 මාර්තු 15	3,058	94.0956	12.66	94.8652	12.50	0.7696
10.70%2035A	10	2035 ජූනි 15	3,150	89.8023	12.67	90.5600	12.51	0.7577
10.85%2036A	12	2036 අගෝස්තු 15	3,577	89.4991	12.75	90.5915	12.54	1.0924
10.75%2037A	12	2037 ජූලි 1	3,897	87.9090	12.86	89.4571	12.56	1.5480
10.50%2039A	20	2039 අගෝස්තු 15	4,672	85.0596	12.91	86.7855	12.60	1.7259
12.00%2041A	25	2041 ජනවාරි 1	5,177	94.0907	12.91	96.1188	12.59	2.0282
09.00%2043A	30	2043 ජූනි 1	6,058	73.2168	12.96	75.1042	12.61	1.8874
13.50%2044A	30	2044 ජනවාරි 1	6,272	103.4434	12.99	106.1285	12.61	2.6851
13.50%2044B	30	2044 ජූනි 1	6,424	103.3075	13.01	106.2801	12.60	2.9726
12.50%2045A	30	2045 මාර්තු 1	6,697	95.6022	13.13	98.7806	12.67	3.1784

3.7 දේශීය ණය ප්‍රශස්ත කිරීමේ වැඩසටහන සහ බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනට අනුව නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩය	පරිණත කාලය (වසර ගණනින්)	පරිණත දිනය (වර්ෂය/මාසය/දිනය)	පරිණතියට ඇති දින ගණන	සාමාන්‍ය ගැනුම් මිල	ඵලදා අනුපාතික %	සාමාන්‍ය විකුණුම් මිල	ඵලදා අනුපාතික %	ගැනුම් හා විකුණුම් මිල පරතරය
12%9%2027A	4	2027 මාර්තු 15	136	98.3499	13.01	99.9665	12.00	1.6166
12%9%2028A	5	2028 අප්‍රේල් 15	533	97.5946	13.01	99.9854	12.00	2.3908
12.4%7.5%5%2029A	5	2029 මාර්තු 15	867	98.1821	13.00	101.1753	12.00	2.9932
12%9%2029A	6	2029 මැයි 15	928	96.9219	13.00	99.9883	12.00	3.0664
12.4%7.5%5%2030A	5	2030 අප්‍රේල් 15	1,263	97.8415	13.00	101.4468	12.00	3.6053
12%9%2030A	8	2030 ජූනි 15	1,324	96.3089	13.00	99.9678	12.00	3.6589
12%9%2031A	8	2031 ජනවාරි 15	1,538	96.0119	13.00	99.9577	12.00	3.9458
12.4%7.5%5%2031A	6	2031 මැයි 15	1,658	97.5295	13.00	101.6715	12.00	4.1420
12%9%2032A	8	2032 පෙබරවාරි 15	1,934	95.5325	13.00	99.9575	12.00	4.4250
12.4%7.5%5%2032A	8	2032 ජූනි 15	2,055	97.2310	13.00	101.8464	12.00	4.6154
12.4%7.5%5%2033A	9	2033 ජනවාරි 15	2,269	97.0863	13.00	101.9314	12.00	4.8451
12%9%2033A	10	2033 මාර්තු 15	2,328	95.1264	10.84	99.9665	14.00	4.8401
12.4%7.5%5%2034A	10	2034 පෙබරවාරි 15	2,665	96.8626	13.00	102.0927	12.00	5.2301
12%9%2034A	10	2034 අප්‍රේල් 15	2,724	94.7825	13.00	99.9854	12.00	5.2029
12.4%7.5%5%2035A	10	2035 මාර්තු 15	3,058	96.6787	13.00	102.2434	12.00	5.5647
12%9%2035A	10	2035 මැයි 15	3,119	94.4682	13.00	99.9883	12.00	5.5201
12.4%7.5%5%2036A	12	2036 අප්‍රේල් 15	3,455	96.5299	13.00	102.3882	12.00	5.8583
12%9%2036A	12	2036 ජූනි 15	3,516	94.1685	13.00	99.9678	12.00	5.7993
12%9%2037A	13	2037 ජනවාරි 15	3,730	94.0232	13.00	99.9577	12.00	5.9345
12.4%7.5%5%2037A	13	2037 මැයි 15	3,850	96.3850	13.00	102.5014	12.00	6.1164
12%9%2038A	15	2038 පෙබරවාරි 15	4,126	93.7980	13.00	99.9575	12.00	6.1595
12.4%7.5%5%2038A	15	2038 ජූනි 15	4,246	96.2327	13.00	102.5776	12.00	6.3449
1.00%2027A	4	2027 ජූලි 15	258	93.4367	13.00	95.2466	12.00	1.8099
1.00%2029A	6	2029 ජූලි 15	989	88.8950	13.00	91.8965	12.00	3.0015
1.00%2031A	8	2031 ජූලි 15	1,719	85.3646	13.00	89.2430	12.00	3.8784
1.00%2033A	10	2033 ජූලි 15	2,450	82.6204	13.00	87.1411	12.00	4.5207
0.50%2036A	11	2036 මාර්තු 15	3,424	77.0300	13.00	82.0187	12.00	4.9887
0.50%2037A	13	2037 සැප්තැම්බර් 15	3,973	75.6827	13.00	80.8890	12.00	5.2063
0.50%2038A	14	2038 සැප්තැම්බර් 15	4,338	74.9159	13.00	80.2385	12.00	5.3226
0.50%2039A	15	2039 සැප්තැම්බර් 15	4,703	74.2399	13.00	79.6594	12.00	5.4195
0.50%2040A	16	2040 සැප්තැම්බර් 15	5,069	73.6439	13.00	79.1441	12.00	5.5002
0.50%2041A	17	2041 සැප්තැම්බර් 15	5,434	73.1184	13.00	78.6855	12.00	5.5671
0.50%2042A	18	2042 සැප්තැම්බර් 15	5,799	72.6552	13.00	78.2773	12.00	5.6221
0.50%2043A	19	2043 සැප්තැම්බර් 15	6,164	72.2467	13.00	77.9140	12.00	5.6673
01.00%2026A	2	2026 ජූලි 15	-107					
01.00%2028A	4	2028 ජූලි 15	624	91.0230	13.00	93.4741	12.00	2.4511
01.00%2030A	6	2030 ජූලි 15	1,354	87.0188	13.00	90.4925	12.00	3.4737
01.00%2032A	8	2032 ජූලි 15	2,085	83.9062	13.00	88.1309	12.00	4.2247
01.00%2034A	10	2034 ජූලි 15	2,815	81.4867	13.00	86.2602	12.00	4.7735


මූලාශ්‍ර: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මූල්‍ය, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

විදේශීය අංශය

4.1 විනිමය අනුපාතික

අයිතමය (ඒකක යකට රුපියල්) (අ)	2026 ඔක්තෝබර් 30			සාමාන්‍යය අනුපාතිකය	
	ගැනුම්	විකුණුම්	සාමාන්‍යය	සතියකට පෙර	වසරකට පෙර
එ.ජ. ඩොලර්	328.04	337.14	332.59	332.35	304.45
ස්ටර්ලිං පවුම්	438.27	452.87	445.57	445.28	402.04
ජපන් යෙන්	2.08	2.15	2.11	2.12	2.00
යූරෝ	365.89	378.92	372.41	372.72	353.63
ඉන්දියානු රුපියල් (ආ)			3.49	3.50	3.44
විශේෂ ගැනුම් හිමිකම් (2026 ඔක් 29 දිනට)			449.71	450.07	414.78

දෛනික විනිමය අනුපාතික



මහ බැංකුව විසින් සිදු කරන ලද මිලදී ගැනීම් සහ විකිණීම් (එ.ජ. ඩොලර් මිලියන) (ඇ)(අ)	2025 සැප්තැම්බර්	2026 අගෝස්තු	2026 සැප්තැම්බර්
මිල දී ගැනීම්	187.8	579.0	85.0
විකිණීම්	-	-	20.8

අයිතමය	වසරකට පෙර	සතියකට පෙර	2026-10-30
සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන)	67.91	32.41	32.23

(වාණිජ බැංකු අතර සිදුවන එතැන්, පසුදින සහ එදින ගනුදෙනු)


ඉදිරි විනිමය ගනුදෙනු

ඉදිරි විනිමය අනුපාතික (රු/එ.ජ. ඩොලර්) (ඉ)			
මාස 1	304.91	333.20	333.86
මාස 3	306.54	336.20	336.63
සාමාන්‍ය දෛනික අන්තර් බැංකු ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන)	31.08	27.34	33.29
නොපියවූ ඉදිරි විනිමය ගනුදෙනු පරිමාව (එ.ජ. ඩොලර් මිලියන) (2026 ඔක් 29 දිනට)	1,039.74	887.53	941.05


4.2 සංචාරක සේවා සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

		2025 සැප්තැම්බර්	2026 (ඊ) සැප්තැම්බර්	2025 ජන - සැප්	2026 (ඊ) ජන - සැප්	% වෙනස
සංචාරක පැමිණීම්	සංඛ්‍යාව	158,971	158,557	1,725,494	1,693,679	(1.8)
		2025 සැප්තැම්බර්	2026 (ඊ)(උ) සැප්තැම්බර්	2025 ජන - සැප්	2026 (ඊ)(උ) ජන - සැප්	% වෙනස
සංචාරක ඉපැයීම්	(එ.ජ. ඩොලර් මිලියන)	182.9	185.6 (උම)	2,472.9	2,245.2 (උම)	(9.2)
	(රුපියල් බිලියන)	55.3	61.2 (උම)	738.4	720.2 (උම)	(2.5)
		2025 සැප්තැම්බර්	2026 (ඊ) සැප්තැම්බර්	2025 ජන - සැප්	2026 (ඊ) ජන - සැප්	% වෙනස
විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් (ඒ)	(එ.ජ. ඩොලර් මිලියන)	695.7	734.4	5,811.7	6,865.4	18.1
	(රුපියල් බිලියන)	210.3	242.0	1,738.7	2,215.4	27.4

සංචාරක පැමිණීම්



විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්



(අ) වාණිජ බැංකුවල සාමාන්‍ය මධ්‍යස්ථ අනුපාතිකය (පෙ.ව. 9.30 ට පවතින)
(ආ) මහ බැංකුවේ දෛනික මධ්‍යය විනිමය අනුපාතිකය
(ඇ) මාසය තුළ මහ බැංකුව විසින්, වාණිජ බැංකු වෙතින් වෙළඳපොළ මිලට සිදු කරනු ලබන සමස්ත විකිණීම් සහ මිලදී ගැනීම්
(අ) මහ බැංකුවේ විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත්වීම් වටිනාකම මත පදනම් වූ දිනයට අනුව වේ.
(ඉ) සැබෑ ගනුදෙනු මත පදනම් වූ සතියේ සාමාන්‍යය
(ඊ) තාවකාලික
(උ) සංශෝධිත
(උම) සංචාරක පැමිණීම්, සාමාන්‍ය දෛනික වියදම සහ සාමාන්‍ය රැඳී සිටීමේ කාලය පිළිබඳ රට අනුව දත්ත ඇතුළත් කරමින්, මාසික සංචාරක ඉපැයීම් ඇස්තමේන්තු වල නිරවද්‍යතාවය සහ නියෝජනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2026 මැයි මාසයේ දී මාසික සංචාරක ඉපැයීම් ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කර ඇත.
(ඒ) විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිවීවා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

4.3 2026 සැප්තැම්බර් අවසානයට විදේශ සංචිත සහ විදේශ මුදල් ද්‍රවශීලතාවය [අ]
(එ.ජ. ඩොලර් මිලියන)

නිල සංචිත වත්කම් [ආ]	6,867
විදේශ මුදල් සංචිත	6,623
(අ) සුරැකුම්පත්	3,640
(ආ) මුළු මුදල් සහ තැන්පතු	2,983
(i) වෙනත් මහ බැංකු, පියවීම් සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ජා.මූ. අරමුදල සමඟ	1,929
(ii) විදේශයන්හි පිහිටි වාර්තා කරන රට තුළ මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ	1
(iii) වාර්තා කරන රටෙන් පිටත මූලස්ථානය පිහිටා ඇති බැංකු සමඟ	1,053
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	4
විශේෂ ගැනුම් හිමිකම්	43
රත්‍රන්	198
අනෙකුත් සංචිත වත්කම්	0

විදේශ සංචිත මගින් ඉදිරියේදී සිදුකළ යුතු කෙටිකාලීන ශුද්ධ ගෙවීම් [ඇ] (එ.ජ. ඩොලර් මිලියන)

අයිතමය	එකතුව	කල්පිරීම (ඉතිරිව ඇති කාලය අනුව)		
		මාසයක් ඇතුළත	මාස 1 ට වැඩි සහ මාස 3 දක්වා	මාස 3 ට වැඩි සහ වසරක් දක්වා
1. විදේශ ණය, සුරැකුම්පත් සහ තැන්පතු [ඈ]	**(2,173)**	**(45)**	**(499)**	**(1,629)**
ගෙවීම් (–) ණය වාරික ආපසු ගෙවීම	(1,309)	(17)	(294)	(999)
ගෙවීම් (–) පොලිය	(864)	(29)	(205)	(631)
ලැබීම් (+) ණය වාරික ආපසු ලැබීම				
ලැබීම් (+) පොලිය				
2. විදේශ මුදලින් සහ දේශීය මුදලින් පවතින ඉදිරි ගිවිසුම් සහ අනාගත සුරැකුම්වල සමස්ත හිඟ සහ අතිරික්ත තත්ත්වය (විනිමය හුවමාරු ගිවිසුම්වල ඉදිරි ගනුදෙනු ද (forward leg) අන්තර්ගතව)	**(3,580)**	**(375)**	**(2,180)**	**(1,025)**
හිඟ (–) [ඉ]	(3,580)	(375)	(2,180)	(1,025)
අතිරික්ත (+)				
3. අනෙකුත්	**(1)**	**(1)**		
ප්‍රතිවිකිණුම් හා සම්බන්ධ ලැබීම් (+)				
ප්‍රතිමිලදී ගැනීම් හා සම්බන්ධ ගෙවීම් (-)				
අනෙකුත් ගෙවිය යුතු ගිණුම් (–)	(1)	(1)		


(අ) තාවකාලික
(ආ) චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.
(ඇ) මෙහි ඉදිරියේ දී සිදුකළ යුතු ගෙවීම් ප්‍රධාන වශයෙන් අන්තර්ගත වේ.
(ඈ) 2024 දෙසැම්බර් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිමියන් සමඟ එකඟ වූ ප්‍රතිව්‍යුහගත කිරීමේ කොන්දේසිවලට අදාළ ගෙවීම් මෙම ශුද්ධ ගෙවීම්වලට ඇතුළත් වේ.
(ඉ) ඉදිරි විනිමය හුවමාරු ගිවිසුම්වල වැඩි කොටසක් නොපියවා ඉදිරියට ගෙනයනු ලැබේ.


4.4 විදේශීය වෙළඳාම (අ)


අයිතමය	ජන - සැප් (එ.ජ. ඩොලර් මිලියන)			ජන - සැප් (රුපියල් මිලියන)		
	2025	2026 (ආ)	% වෙනස	2025	2026 (ආ)	% වෙනස
අපනයන	10,215.1	10,754.0	5.3	3,055,795.4	3,475,669.4	13.7
කෘෂිකාර්මික	2,323.6	2,317.4	(0.3)	695,378.8	749,347.3	7.8
කාර්මික	7,854.2	8,398.1	6.9	2,349,234.2	2,714,011.3	15.5
ආහාර, පාන හා දුම්කොළ	662.4	702.6	6.1	198,240.0	226,746.8	14.4
රෙදිපිළි හා ඇඟලුම්	4,021.3	3,797.0	(5.6)	1,202,663.4	1,226,703.6	2.0
ඛනිජ තෙල් නිෂ්පාදිත	719.9	1,094.8	52.1	215,234.9	354,123.3	64.5
සම් භාණ්ඩ හා රබර් නිෂ්පාදිත	743.2	799.8	7.6	222,250.6	258,767.9	16.4
වෙනත්	1,707.4	2,004.0	17.4	510,845.2	647,669.6	26.8
ඛනිජ අපනයන	18.1	24.5	35.2	5,428.3	7,835.3	44.3
වෙනත් අපනයන	19.2	13.9	(27.5)	5,754.1	4,475.5	(22.2)
ආනයන	15,389.5	18,665.7	21.3	4,604,256.5	6,028,989.1	30.9
පාරිභෝගික භාණ්ඩ	3,816.4	4,484.6	17.5	1,142,412.5	1,447,450.7	26.7
අන්තර් භාණ්ඩ	8,617.2	10,456.2	21.3	2,577,557.5	3,375,935.7	31.0
ආයෝජන භාණ්ඩ	2,943.9	3,709.8	26.0	880,710.8	1,200,674.1	36.3
වෙනත්	12.0	15.1	26.1	3,575.8	4,928.7	37.8
වෙළඳ ශේෂය	(5,174.4)	(7,911.7)		(1,548,461.1)	(2,553,319.7)	

4.5 වෙළඳ දර්ශක (2010= 100) (අ)(ආ)(ඇ)

අයිතමය	පෙර වසර	පෙර මාසය	2026 සැප්
මුළු අපනයන			
වටිනාකම	158.5	172.6	191.7
ප්‍රමාණය	196.2	206.3	225.7
ඒකක වටිනාකම	80.8	83.7	84.9
මුළු ආනයන			
වටිනාකම	183.3	171.3	188.7
ප්‍රමාණය	197.8	158.3	187.7
ඒකක වටිනාකම	92.7	108.2	100.5
වෙළඳ මිල අනුපාතය	87.1	77.3	84.5










4.6 වෙළඳ භාණ්ඩ මිල ගණන්

	එ.ජ. ඩොලර්			රුපියල්		
	සැප්තැම්බර්		%	සැප්තැම්බර්		%
	2025	2026 (ආ)	වෙනස	2025	2026 (ආ)	වෙනස
කොළඹ තේ වෙන්දේසිය						
තේ මිල (කි.ග්‍රෑම් 1 ක්)	4.02	3.73	(7.2)	1,210.61	1,228.75	1.5
ආනයන (මි.ර.ගැ.)						
සහල් (මෙට්‍රික් ටොන් 1 ක්)	957.00	1,057.22	10.5	289,202.53	348,391.82	20.5
සීනි (මෙට්‍රික් ටොන් 1 ක්)	538.03	573.16	6.5	162,589.11	188,877.64	16.2
තිරිඟු (මෙට්‍රික් ටොන් 1 ක්)	285.25	354.40	24.2	86,201.16	116,788.69	35.5
බොරතෙල් (බැරලයක්)	73.51	86.62	17.8	22,213.56	28,545.54	28.5







(අ) ඇතැම් සංඛ්‍යා සටහන්වල අගයන් එක් දශමස්ථානයක් දක්වා ඉදිරිපත් ඇත.
(ආ) තාවකාලික
(ඇ) එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද